සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
**Department of Samurdhi Development**
කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
மகளிர் சிறுவர் அலுவல்கள் மற்றும் சமூக வலுவூட்டல் அமைச்சு
**Ministry of Women, Child Affairs and Social Empowerment**

මගේ අංකය / எனது இல / My No: DSD/HO/05/MF/15/1වකුලේඛන
ඔබේ අංකය / உமது இல / Your No: ..............................
දිනය / திகதி / Date: 2023.03.14

සියළුම ප්‍රජාමූල විධායක කමිටු / බැංකු පාලක මණ්ඩල සභාපතිවරුන්

සමෘද්ධි බැංකු හා බැංකු සමිති කළමණාකරුවන් වෙත

<u>ගර්භණී හා කිරිදෙන මව්වරුන් සඳහා රු.2500/- ක අතිරේක ආහාර සහනාධාර මුදල් බැංකු මගින් ලබා දීමේ වැඩසටහන</u>

පවතින ආර්ථික තත්ත්වය හමුවේ පීඩාවට පත් ගර්භනී හා කිරිදෙන මව්වරුන් සඳහා සමෘද්ධි බැංකු හරහා රු.2500/- ක අතිරේක ආහාර සහනාධාර මුදල් ගෙවීමට සැලසුම් කර ඇත.

මෙම දීමනා ලබන පුද්ගලයින් සඳහා ලැබෙන මුදල් ගිණුම්ගත කිරීම සඳහා සමෘද්ධි ප්‍රජාමූල බැංකුවේ පොදු ලෙජරයේ පහත ගිණුම් අළුතින් ආරම්භ කළ යුතුය.

- ගර්භනී හා කිරිදෙන මව්වරුන් සඳහා ගෙවනු ලබන දීමනා රැස් කිරීමේ ගිණුම - ක්ෂේත අංකය 4067

එම මුදල් ජංගම ගිණුමට බැර වූ පසු පහත පරිදි පැවැරුම් භාවිතා කර පොදු ලෙජරයේ සටහන් තැබිය යුතුය

ජංගම ගිණුම - හර 3001

ගර්භණී හා කිරිදෙන මව්වරුන් සඳහා ගෙවනු ලබන දීමනා රැස් කිරීමේ ගිණුම - බැර 4067

එසේම පරිගණක මෘදුකාංග පද්ධතිය ක්‍රියාත්මක බැංකු Common Distribution Panel හරහා ප්‍රතිලාභින්ගේ ඉතිරි කිරීම් ගිණුම් වලට බැර කිරීම් කළ යුතුය. එහිදී දී ඇති උපදෙස් පරිදි අවශ්‍ය පියවර භාවිතා කර Panel එක ක්‍රියාත්මක කළ යුතු බව දන්වන අතර පහත ගිණුම් සටහන් තැබිය යුතුය.

- ගර්භනී හා කිරිදෙන මව්වරුන් සඳහා ගෙවනු ලබන දීමනා රැස් කිරීමේ ගිණුම - හර

සාමාජික තැන්පත්/ දිරියමාතා/සාමාජික නොවන ගිණුම බැර

ඉහත දීමනා manual කිරීමේදි මෙම ගිණුම් ක්‍රියාවලිය අනුවම සටහන් තැබීම කළ යුතුය.

ආර්.පී.කේ. තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් -

1. ලේකම් , කාන්තා ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය - කාරු.දැ.ග.ස.
2. සියළුම දිස්ත්‍රික් ලේකම්/ දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන් - කාරු.දැ.ග.ස.
3. දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන් , දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කාරු.දැ.ග.ස.
4. ප්‍රධාන අභ්‍යන්තර විගණක , සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කාරු.දැ.ග.ස
5. සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් , ප්‍රදේශීය ලේකම් කාර්යාලය - කාරු.දැ.ග.ස
6. නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂවරුන් - කාරු.දැ.ග.ස